# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 අප්‍රේල් මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 2.50 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 අප්‍රේල් මස 23 වන දින]

එල්.ඩී.—ඕ. 14/2013.

## 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2013 අංක 15 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, එකී පනත 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.

**2.** 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

2003 අංක 3 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එම වගන්තියේ (ඉ) ඡේදයේ "4.5%" යන ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට "7%" යන ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) එම වගන්තියේ (ඊ) ඡේදයේ "2006 ජනවාරි මස 1 වන දිනයෙන්", "සියයට අසූපහක්"සහ "2013 ජනවාරි මස 1 වන දිනයෙන්" යන ඉලක්කම් සහ වචන ඉවත් කර ඒ වෙනුවට පිළිවෙලින් "2013 ජනවාරි මස 1 වන දිනයෙන්", "සියයට අසූවක්" සහ "2020 ජනවාරි මස 1 වන දිනයෙන්" යන ඉලක්කම් සහ වචන ආදේශ කිරීමෙන්.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.